# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව.
# 2020.11.03

වර්ෂ 2020 ක් වූ නොවැම්බර් මස 03 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පැවැත්වූ විශේෂ මහා සභා රැස්වීම් වාර්තාවයි.

**සහභාගීත්වය.**

1. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
2. ගරු මන්ත්‍රී එම්.එන්. හුසෙන් කියාස් මැතිතුමා
3. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
4. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
5. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
6. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
7. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
8. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
9. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
10. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
11. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
12. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
13. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
14. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
15. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**නොපැමිණි**

1. ගරු උප සභාපති ජේ. ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
2. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
3. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
4. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
5. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
6. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
7. ගරු මන්ත්‍රීනී ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

මීට අමතරව ප්‍රාදේශීය සභා ලේකම් අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියළුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩි 2ක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද විශේෂ සභාවක් කැඳවන්න තීරණය කරපු හේතුව පසුගිය කාලයේ අනවසර ඉදිකිරීම් පිළිබඳ ඔබතුමන්ලා විසින් දිගින් දිගටම ඉදිරිපත් කරපු චෝදනාවන් පිළිබඳ නෛතික ක්‍රියාමාර්ග පිළිබඳ තීන්දු ගන්න. කොරෝනා තත්වය තුළ අද රැස්වීම

පැවැත්වීම හොඳ තත්වයක් නෙමෙයි තියෙන්නේ. ඇඳිරි නීතිය නොමැති ප්‍රදේශ වල රැස්වීම් පැවැත්වීම පිළිබඳව සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් අපට මාර්ගෝපදේශනයක් එවලා තියෙනවා.

එහෙම තියෙද්දිත් ඔබතුමන්ලා ඉල්ලපු නිසා තමයි අනවසර කටයුතු පිළිබඳ තීන්දු තීරණ ගන්න අද විශේෂ සභාවක් කැදෙව්වේ. මේක පැයකින් ඉවර කරමු. සේවකයින්ගෙනුත් 50%ක් තමයි වැඩට ගෙන්වගන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** පළමුව විශේෂ සභාවක් පැවැත්වීම පිළිබඳව ස්තූතිය පළකරන්න ඕන සභාපතිතුමාට. හැබැයි මේ වගේ විශේෂ සභාවක් තියන්න අවශ්‍ය නැහැ, මමනම් කියන්නේ කලිනුත් විශේෂ සභා තුනක් විතර තියලා තියෙනවා. ආයේ විශේෂ සභාවක් අද කැඳවනවා. තීන්දු තීරණ ගන්න කියලා. කලින් ගත්තානේ. අවශ්‍ය තීන්දු අපි කෙටියෙන් ඉවර කරමු. අවශ්‍ය දේවල් ටික විතරක් කතා කරලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි විධිමත් සභා තීරණයක් ගමු අද. අපි වාර්තාවක් ඉදිරිපත් කරලා තියෙනවා. හැකි පමණින්. කෝ නිලධාරීන්. කෝ T.O.ලා ඇවිල්ලද?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, පළමුව ස්තූතිවන්ත වෙන්න ඕන මේ වගේ තත්වයක් තුළ සභා රැස්වීමක් තිබීම පිළිබඳව. ඔබතුමාට උවමනාවක් තියෙන නිසයි අනවසර ඉදිකිරීම් එක්කම මේ බල ප්‍රදේශයේ සිද්ධ වෙන අකටයුතුකම් නතර කිරීමට මේ රැස්වීම කැදෙව්වේ. ඒ වුනාට අද මේ දීලා තියෙන වාර්තාව මම නම් පිළිගන්නේ නැහැ. කෝ මේ නිලධාරීන් ඔවුනුත් ඉන්න ඕන. අද වේලාව මදි මේ වාර්තාව කියවන්න. මම ලඟ තියෙනවා මේවට අදාළ ලිපිගොනු. සභාවේ නැත්නම් ඕනවටත් වඩා මම ළග තියෙනවා. ඉන්දික මන්ත්‍රීතුමාට කෝල් එකක් ගන්න. එයා ලඟ ලිපිගොනුව ඇති. අපි ඇත්තටම 2017, 2015, 2014 දිගටම නඩු දාලා තියෙනවා. අපි නීතීඥ මහත්වරුන්ට සල්ලි වියදම් කරලා නඩු පරාද වෙලා තියෙනවා. දිනන්න ඕන නඩුත් පරාද වෙලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා අපි අද විධිමත් සභා තීන්දුවක් ගමු. අපි සැලසුම් කමිටුවට මේක භාර දෙමු. එහිදී තීරණයක් ගමු. චුට්ටක් මේක අහන්න. අපි මෙතනදී තෝරා ගමු මොනවද කරන්නේ කියලා. මේ කරුණු දාහතර ගැන තීරණයක් සැලසුම් කමිටුව මගින් ගමු. අර එදා යෝජනා කරපු දහතුනයි, ලීඩ්ස් එකයි, දාහතරම ගමු.

එදාට නිලධාරීන් කැඳවලා වෙන කිසිම දෙයක් ගන්නේ නැතිව වෙනමම නඩු දාන ඒවා තෝරලා නඩු දාමු. මොකද සේරටම නඩු දාන්න ඕන වෙන්නේ නැහැ. අනෙක් ඒවාට කාර්මික නිලධාරීන්ගෙන් වාර්තා කැඳවලා දීලා තියෙන නිසා. ඒවායේ නිර්දේශ අනුව සමහර ඒවා අයින් වෙයිනේ. කමිටුවේ සාමාජිකයන් විතරයි එදාට ගෙන්වන්නේ. කාරණා දහතුනට අදාළ විධිමත් තීරණයක් ගනිමු. අපි දාහතරටම නඩු දානවා කියන එක නෙවෙයි. ඕවා ගෙනල්ලා කමිටුවත් එක්ක එකට ඉඳලා විධිමත් ක්‍රමයකින් නඩු දාමු.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** කෝ අපිට වාර්තා හම්බ වුනේ නැහැ

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වාර්තා දුන්නේ නැත්තේ ඇයි?

(ලේකම්තුමාගෙන් විමසයි)

හා මෙහෙමයි, අදාළ නිලධාරිනිය 50% පැමිණීම නිසා පසුගිය දිනවල ඇවිල්ලා නැහැ. ඔවුන් එන්නේ බස්වල. ඔවුන්ව වැඩට ගෙන්න ගන්න විදියක් නැහැ. එකක දෙකක අදාළ දින දාලා නැත්තේ ඒකයි. ඒවා එම ලිපිගොනු වලින් ගන්න ඕන. විෂය නිලධාරිනිය දින තුනකින් වැඩට ඇවිල්ලා නෑ. දැන් ඒකයි වාර්තාවේ දිනවල අඩුපාඩු ඇත්තේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ වාර්තා ඊයේවත් අපිට ලැබුණ නම් කියවන්න තිබුණා. මේ ලිපිගොනු සභාව තුළ තියෙන්න ඕන. ඔබතුමා කමිටුවක් දැම්මට මම ඔබතුමාගෙන් ඉල්ලනවා. නිල වශයෙන් ඒ පත්කරපු නිලධාරියාට භාර දෙන්න. එතුමා හොඳයි. ඉන්ද්‍රජිත් මහත්තයා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි මේක සැලසුම් කමිටුව මගින් තීරණ අරගෙන ක්‍රියා කරමු දාලා විධිමත් ක්‍රමයකින් නඩු දාමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සැලසුම් කමිටුවට දාලා වැඩක් නැහැ. නීතීඥයන්ට නඩු භාර දීලා වැඩක් නැහැ. නීතීඥ පැනල් එකකට නඩු භාර දෙන්න ඕන. එක්කෙනෙක්ට දෙන්න නරකයි සේරම. මේක පැහැදිලි කරලා දෙන්න ඕන. මෙතනම තියෙනවා බටුවන්තුඩාවේ මවුන්ට් කැල්වරි එකෙත්, හපුගල හන්දියේ සුපර්මාකට් එක ලඟ බිල්ඩිමටත් අවසර දීලා තියෙනවා. මේක කොහොමද වෙන්නේ. පන්සල අසළ කාගිල්ස් ගොඩනැගිල්ලට අනුමැතිය ලැබුනේ කොහොමද? කොහේද අවසර දීලා තියෙන්නේ. තවත් ඒවට අනුමැතිය දීලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දහනායක එකද?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ කාලවේලාව මදි. වාර්තාව කලින් දීලා නැහැ. කෝ අපිට ඒක ඊයේවත් දුන්න නම් ටිකක් කියවන්න තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දින පිළිබඳ තීන්දු ගන්න. මම කියන්නේ කරන්න ඕන දේ මම කියන්නම්. මේ නීතීඥවරු ගැන මම නම් දන්නේ නැහැ. මොනවගේ අයද කියලා. අර පියවරගම පාරක් සම්බන්ධයෙන් නඩුවක් අපි භාර දුන්නා. සඳුන් කියන නීතීඥ මහත්තයට. එයා ජුනියර් කෙනෙක්ට භාර දීලා තියෙනවා ඒක. අපි තිස් හතර දාහක් ගෙව්වා. දැන් අපිව ඒ ගොල්ලෝ වූදිතයෝ කරලා ලියුම් එවලා තියෙනවා. අපි සාක්ෂි විධියට නෙමෙයි නඩුවට දාලා තියෙන්නේ. මේ ගොල්ලෝ නීතීඥවරුද? ඔන්න ඕකයි තත්වය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි නීතීඥ පැනල් එකකට භාර දෙමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ලිපිගොනු සම්පූර්ණයෙන්ම හදලා භාර දීලයි තියෙන්නේ. ඒ ගොල්ලෝ විත්තියට නෙමෙයි. පැමිණිල්ලටයි නඩු දාලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඕක තනි කුනුහරුපයක්නේ! අර කපුහෙම්පල ඉඩමේ ටැංකිය ආරක්ෂා කර ගන්න කියන එකත් මේකත් කුනුහරුපයක්. ගෙවල් වල පදිංචිකරුවන් පදංචි වෙනකල් ආරක්ෂාවක් නැති හින්දා ටැංකිය තියන්නෑ කියලයි නිලධාරීන් කියන්නේ. කණු හතර විතරයි තියෙන්නේ. තාම ටැංකිය තියලා නෑ. වතුර අපිට දෙන්න බෑ. ඒක ඒ ගොල්ලන්ගේ වගකීමක්. ඒක එහෙම වෙන්න බෑ. අපි මේවට පැමිණිලි දැම්මට නවත්තන්නේ නැහැ. පොලිසිය කිව්වට අහන්නෙත් නැහැ. තහනම් නියෝගයක් ගමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපි කලින් ගෙනාපු යෝජනා දා හතර නඩු දාන්න තීරණයක් ගන්නවා. අලුතින් එකක්වත් එපා. මේ කාරණා දාහතරට නඩු දාමු. මේවා බලන්න යන්න දිනයක් දා ගමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අර තට්ටු හතරේ බිල්ඩිම ගැන පසුව තීරණයක් ගමු. ඒක අනුමත කරලා තියෙනවා නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇක්සස් වෙන්දේසි කරපු ඉඩම අනුමත කරලා තියෙනවා නම් ඒවා හොයලා බලන්න. කොහාමද අනුමැතිය දුන්නේ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හෙට පුලුවන්ද අපේ නිලධාරීන් සමග සාකච්චා කරලා උදේ 10.30ට අදාල කමිටුවේ සාමාජික මහත්වරුයි, අදාල කාර්මික නිලධාරිනුයි, මාත් එක්ක ලේකම්තුමයි, අදාල ලිපිගොනු සම්බන්ධ නිලධාරියයි සම්බන්ධ කර ගන්න. එතකොට අදාළ ගොනු ලබා දෙන්න පුලුවන්. අනික ඇක්සස් එක ඇතුලු අර කාරණා දාහතරට අමතරව මේ කාරණාත් සම්බන්ධයෙන් සභාව දැනුවත් කරන්න පුලුවන්.

කාර්මික නිලධාරීන් අතින් අඩුපාඩු වුනා. ඒ ඔවුන්ගේ වැඩ අධිකකම නිසා වෙන්න පුලුවන්. තරංගා ලැන්ඩ් ඉඩම පදිංචියට සුදුසු නෑ. අර ඇක්සස් ඉඩම වුනත් එහෙමයි. මේක තාවකාලික කමිටුවක්. සැලසුම් කමිටුව නෛතික පදනමක් තියෙනවා. මේ කමිටුවට එහෙම නෑ. නිසංසලා මිස් ලඟ මේ ලිපිගොනු තියෙනවා. එයත් මේකට සම්බන්ධ කරලා එයා ලඟ තියෙන ලිපිගොනු ඉල්ලගන්න

පුලුවන්. මේ නිලධාරිනිය හරහා. හැබැයි මේකත් හිතන්න. මම නිලධාරියෙක් පත් කළා. මම මේක වලක්වනවා නෙමෙයි. නමුත් දැන් රමේෂ් මහත්තයා කියනවා. සභා වාර්තා තුනක් හදන්න තියෙනවා කියලා. මේ විශේෂ සභාව කැඳවන්න වෙලාව නැහැ කියලා. මම තවත් නිලධාරිනියක් පත් කළා. එයාගේ අම්මා ලෙඩ වෙල කියලා කියනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අර නළ ලිං ගහපු තැන් ගැන හොයන්න ඕන. අර පස්මාලුව වගේ. අපිට වතුර දෙන්න වේවා. ඒ ආයතන වලට කියන්න ඕන එකඟතාවය අනුව කටයුතු කරන්න කියලා. එකඟතාවයට අදාළ ගිවිසුම් වලින් මට දෙකයි ලැබුනේ. මං චෝදනා කරනවා ඒ අදාළ ප්‍රදේශයේ කාර්මික නිලධාරීන් මේ සඳහා වග කියන්න ඕන කියලා. ඒ කාර්මික නිලධාරීන් හොයලා බලලා වාර්තා කරන්න ඕන. දැන් මේ වෙන්දේසිකාරයෝ අලුත් ක්‍රමයක් හදාගෙන. වෙන්දේසි සමාගම නෙමෙයි අනුමැතිය ගන්නේ. මේවා සොයලා බලන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලිඛිතව අපි දන්වලා තියෙනවා. තවම දෙකයි එවලා තියෙන්නේ. දින දාහතරක් ඇතුලත උත්තර එවන්න කියලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දින දාහතරක් ගත වෙලත් උත්තර එවන්නේ නැත්නම් නීතීඥ මහත්මයෙක් මාර්ගයෙන් ලෙටර් ඩිමාන්ඩ් එකක් යවමු කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි මේක යෝජනා ස්ථිර කර ගනිමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි කමිටුවෙන් සාකච්ජා කරලා ඉවර වෙලා ඊටපස්සේ නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීන් එක්ක සාකච්ජා කරලා තීරණයක් ගනිමු. නඩු දානවද මොකද කියලා.මොකද නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීන් ඉන්න ඕන. මේ යෝජනා දා හතරට කාර්මික නිලධාරීන් ඉදිරිපත් කරපු නිර්දේශ බලන්න ඕන. වැරදි වෙලා තියෙනවා නම් නඩු දාන්න පුලුවන්. කමිටුව විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි දාහතර සඳහා නෛතික ක්‍රියා මාර්ග ගන්න මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම ඒක ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම යෝජනා කරනවා. මේ කමිටුවේ නිත්‍ය සාමාජිකයකු පත් කරා. ඒ සභාව විසින්ම ඒ නිලධාරියා මුලින් මම යෝජනා කරා. ඒක නීත්‍යානුකූලව පත් කරන්න. විෂය ගොනු එයාට දෙන්න. කාර්යාල ක්‍රම අනුව එයාට ගොනු ලබා දෙන්න පුලුවන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඉස්සර සැලසුම් කමිටුව රැස්වෙලා තීරණ අරගෙන යනවා බලන්න. දැන් එහෙ නෑ. නිලධාරීන් කිහිපදෙනා විතරයි යන්නේ. ඔබතුමා යන්නෙම නෑ. වැඩ නිසා වෙන්න ඇති. කපුහෙම්පල පන්සල් කන්ද වෙන්දේසි ඉඩම කැබලි කරලා ඉවරයි. වතුර ටැංකිය නෑ කණු හතර විතරයි. අවසර දීලත් ඉවරයි. අද වෙනකොට

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** උප සභාපතිතුමා ඒක බලන්න ගියා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** උප සභාපති ගියත් කමිටුව හැටියට තමයි තීරණ ගන්න ඕන. ගෙවල් හදනකොට ආරක්ෂාවට කියලා ටැංකිය තියන් නෑ. මරුනෙ මේක. මේක කමිටුවක්ද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මම පරීක්ෂා කරන්නම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඔය කරුණු නිසා තමයි මේ කමිටුවෙ සාමාජිකයෙකු හැටියට මම කතා කරන්නේ. මේ කරුණු දාහතර විතරද? තව ඒවා එක් කරනවාද? කාරණාවෙන් කාරණාව අරගෙන ඉක්මනට ඉවර කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ ඔයගොල්ල ඉදිරිපත් කරපු කරුණු දහතුනයි ලීඩ්ස් එකයි විතරයි. ඒවා කරුණු හොයලා නඩු දාන ඒවා විතරක් නඩු දාමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** හරි අපි ඔය කරුණු දාහතර ඉස්සෙල්ලා ඉවරයක් කර ගමු. මේ කමිටුව දිගටම තියෙනවා නේ. දාහතරට අමතරව එන ඒවා එකතු කර ගමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ කරුණු ටිකත් කියන්න ඕන. නීතීඥවරුන්ට වෙනම ගෙවන්න ඕන. නඩු වලට වෙනම ගෙවන්න ඕන. තහනම් නියෝග වලට වෙනම ගෙවන්න ඕන. ලබන වසරේ සංවර්ධන වැඩ කටයුතු නවත්වන්න වේවි. මම කැමතියි අනවසර ඒවට විරුද්ධව නිතිමය කටයුතු කරනවට. දැනුවත් වෙන්න ඕන නිසයි කිව්වේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි නිලධාරීන් අපහසුතාවයට පත් කරන්න හොද නෑ. කියලා ඔබතුමා කිව්වා. මමත් පිළිගන්නවා ඒක. මේකෙ වරද මේවට නියම විසඳුමක් ගත්තේ නැති නිසා. මේ ප්‍රශ්න මම කලින් සභාවේ ඉදිද්දිත් කිව්වා. විසඳුම් දුන්නා නම් අද මේ ප්‍රශ්න එන්නේ නැහැ. මේ කාර්මික නිලධාරින් හරියට මේ කටයුතු පිළිබඳ නිවැරදි ක්‍රමයට කටයුතු කරන්න ඕන. නීත්‍යානුකුලව අනුමැතිය දෙන්න කියලා යෝජනා කරනවා. කාර්මික නිලධාරීන් අපි දන්න එය. ඒ අය අපහසුතාවයට පත් වෙන්න හොද නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉදිරියේදී අනවසර ඉදි කිරීම් වෙනවා නම් එම ඉදිකිරීම් පිළිබඳව මාව දැනුවත් කරන්න. මම ඒ බව හොයලා බලලා සභාවට වාර්තා කරනවා. එහෙනම් අද සභාව ඉවර කරමු. පැමිණි සියලු දෙනාටම ස්තුතියි.

බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවැත්වූ විශේෂ සභා රැස්වීම අවසන් කරන ලදි.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.